සන්නස SANNASA

# අපේ පන්සල පාරමිතා විහාරය

**මහින්ද දිසානායක දිවුල්ගනේ**

රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරස්ථානය මෙල්බන් නුව දිප්තිමත් පහන් ටැඹක් මෙන් හුදී බෞද්ධ ජනතාවට දහම් ආලෝකය ලබා දෙමින් සිය දහස් ගණනින් මිනිස් නුවණැස දල්වාලන මෙල්බන් බටහිර ප්‍රදේශයේ පිහිටි පූණ්‍ය භූමියකි.

බටහිර වික්ටෝරියානු ශ්‍රී ලංකා බෞද්ධ සංගමය පිහිටුවා වසර ගණනාවක් ගෙවී යන මේ මොහොතේ අප ලබා ඇති ප්‍රගතිය අති ප්‍රශංශණීය වේ. අප උපන් මව්බිම වු ශ්‍රී ලංකාවේත්, මුලු ඕස්ට්‍රේලියාව තුළ ත් විශේෂයෙන්ම මෙල්බන් පුරවරයේ ලැබු ප්‍රසංසා ප5සාදය අති විශාලය. අප ශ්‍රී ලංකා බෞද්ධ සංගමය තැබු පියවර සෙ මෙන් වුවද රටට ප්‍රදේශයට වවිහ්ෂයෙන්ම කුදුමහත් බෞද්ධ ජනතාවට සලසන සේවය විශාල මෙන්ම ප්‍රසාද ජනකය.

වර්ෂ 1997 අගෝස්තු මස නිවසකට එක්වු ඕස්ට්‍රේලියා මෙල්බන් නුවර පදිංචියට පැමිණි බෞද්ධ පරිසරයක හැදි වැඩුනු සමාජ හිතකාමි දොළොස් දෙනෙකුගෙන් පමණ සෑදුණු තරුණ පිරිසක් ආරම්භ කරන්නට යෙදුණු මෙම බෞද්ධ සංගමය අද වන විටදි අතු ඉති දැමූ මහා වෘක්ෂයක්මෙන් ජනතාවගේ යහපත සඳහාම ඵල දරමින් සෙවන සදයි.

එදා මේ පිරිසගේ එකම අභිලාෂය වුයේ මෙතෙක් ප්‍රදේශයට අඩුපාඩුවක්ව පැවති නව විහාරස්ථානයක් ඉදිකිරීමේ සිහිනයයි. ක්‍රම ක්‍රමයෙන් ඉහලගිය සාමාජික සංඛ්‍යාවක් එකතුකර ගනිමින් මුලින්ම වර්ෂ 1999 මැයි 26 වෙනිදා සෙන්ට් ඕල්බන්ස් ඇඩිලේස්විදිය් කුලී නිවසක පළමු විහාරස්ථානය විහාරස්ථානයකට යෝගය පරිදි එය පිලියෙල කර වර්තමානයේ අප විහාරස්ථානයේ විහාරාධිපති ශ්‍රාස්ත්‍ර5පති ගරු පල්ලේවෙල දේවරක්ඛිත හිමිපානන්ගේ අනුශාසනා පරිදි ගෞරවණීය පණ්ඩිත උඩුවර දේවානන්ද හිමිපානන් වහන්සේ බෞද්ධ ජනතාවගේ උතුම් වූ සිහිනය සැබෑ කරමින් මෙම මුල්ම විහාරස්ථානයේ වැඩ සිටිමට උන්වහන්සේ භාග්‍ය සම්පන්න වියී ශාසන හිතකාමී උගත් ගුණවත් සිල්වත් ස්වාමින්වහන්සේලා වැඩි පිරිසක් මෙම විහාරස්ථානයේ වැඩ සිටි අතර බෞද්ද අබෞද්ධ භේදයකින් තොරව සාමපිකත්වය ක්‍රමයෙන් වර්ධනයවිම නිසා වාහන නැවැත්විමේ පහසුකම්ද මෙම විහාරස්ථානයේ අඩුවිම හේතුවෙන් වැඩි ඉඩකඩ මෙන්ම සියලු පහසුකම් ඇති ස්ථානයක ගෙන යාමේ අවශ්‍යතාවය දැණුනු බැවින් 2007 වසරේදි වත්මන් විහාරස්ථානය පවත්වාගෙන යන රොක්බෑන්ක් ප්‍රදේශයේ ඉඩකඩ ඇතිමෙම ස්ථානයට ගෙන ඒමට බෞද්ධ සංගමය තීරණය කරන ලදී.

මෙම විහාරස්ථානය පවත්වාගෙන යාම පමණක් නොව ප්‍රදේශයේ වසන දරුවන්ට සිංහල අධ්‍යාපනය ලබාදීම සඳහා ආරම්භ කරනලද සිංහල භාෂා පාසැලද මෙම විහාරස්ථානයට සමගාමීව සංගමය විසින් පවත්වාගෙන ගිය අතර බෞද්ධ වටපිටාවක් තුල සිංහල භාෂාව හැදෑරීමට අප



දරුවන්ට හැකිවෙමින් පැවැතීම සතුටට කරුණකි.

එමෙන්ම එදා සුලු පිරිසකගෙන් ආරම්භ කල බටහිර වික්ටෝරියානු අප බෞද්ධ සංගමයේ අද වන විට සාමාපිකත්වය හාරසීයකට වැඩි ප්‍රමාණයක් වර්ධනය වී තිබේ. එදා දරුවන් දොළොස් දෙනෙකුගෙන් පමණ ආරම්භ කළ සිංහල භාෂා පාසැලේ අද වන විටදි දරුවන් දෙසීයකට ආසන්න ප්‍රමාණයක් සිංහල භාෂාව හදාරමින් සිටී.

එදා මෙදා තුර රොක්බැන්ක් පාරමිතා බෞද්ධ විහාරස්ථානයෙන් ප්‍රදේශයට සිදු කෙරෙන ආගමික, ශාසනික, සංස්කෘතික හා සාමාපිකමෙහෙවර මෙතැකැයි කියා ප්‍රමාණ කළ නොහැකිය. දිනෙන් දින වර්ධනය වන සාමාපිකත්වය තුලින් හා විහාරස්ථානය වටා එක්රොක්වන විශාල පිරිසකගෙන් ඒ බව අප කාහටත් ප්‍රත්‍යක්‍ෂ කර ගත හැකි වේ.

ආගමික හා සාමාපික කටයුතු කිරීමට එදා එක් ස්වාමින්වහන්සේ කෙනෙකුගෙන් පමණක් වැඩ සිටි අතර අද අප විහාරස්ථානයේ ගුරු ස්වාමින් වහන්සේලා හතර පස් නමක්ම වැඩසිටිම දායක කාරක සැමගේ ප්‍රසාදය සඳහා හේතුවන අතර බෞද්ධ සැමගේ ආගමික කටයුතු කරගෙන යාමටද එය මහඟු පිටුවහලක් වී ඇත.

සියලු කටයුතු මෙසේවුවද කාලයත් සමගම නැවත රර්ථමානයේදී විහාරස්ථානය පවත්වාගෙන යන ස්ථානය වාහන නැවැත්වීමේ හා අනිකුත් පහසුකම්ද අඩුවීම හේතුවෙන් සියලුම අංගෝපාංගයන්ගෙන් පරිපුර්න වු විශාල ඉඩ කඩක් ඇති නව ස්ථානයකට රැගෙන ගොස් විහාරස්ථානයක් ගොඩ නැගීමේ පරම පූජනීය වු යහපත් චේතනාවත් පෙර දැරි කරගෙන සංගමයේ නිලධාරි මණ්ඩලයේ හා ප්‍රදේශයේ අනිකුත් විශාල පිරිසකගේද සහයෝගයෙන් අක්කර පහකට නොවැඩි බිම් ප්‍රදේශයක් වර්ථමානයේ අප විහාරස්ථානය පවතින තැනට ආසන්නයේ මිලදී ගෙන සීඝ්‍රයෙන් නව විහාරස්ථානයේ වැඩ කටයුතු කිරිමට ආරම්බ කර තිබිම සියලු බෞද්ධ හිතකාමී පිරිස ගේ හා බෞද්ධ සංගමයේ ඉමහත් සතුට, ප්‍රීතිය සඳහා හේතු වී තිබේ.

විහාරස්ථානයේ කෙරෙන පොදු මහත් ආගමික සාමාපික කටයුතු වලට අමතරව වෙසක්, පොසොන් විශේෂ උත්සවත්, කඨින මහා පිංකම්, ප්‍රදේශයේ බෞද්ධ ආගමිකයන් සිල් ගැන්වීමේ මාසික වැඩසටහන හා ධර්ම දේශනා වැඩ සටහන, සතිපතා පවත් වන ධම් සාකච්ඡා, ළමා දහම් වැඩසටහන් මේ අතර ප්‍රධානත්වයේ ලා සැලකිය හැකිය.

එපමණකින් නොව සංස්කෘතිමය වශයෙන් වර්ෂයකට වරක් පවත්වන මහා සංස්කෘත සිංහල අවුරුදු උත්සවය සිංහල භාෂා පාසල මගින් පවත්වන විවිධ ප්‍රසංගය වැනි විශේෂ වැඩ සටහන් සඳහන් කළ හැකියි මෙහිදී සිහිපත් කල යුතු වැදගත් දෙයක් වන්නේ අප විහාරස්ථානයට සම්බන්ධ සිංහල භාෂා පාසල පවා පවත්වාගෙන යා යුත්තේ විහාරස්ථානයේ ගාඩ නැගිල්ලක වුවද දැනට වෙනම රජයේ පාසලක පවත් වන මෙම භාෂා පාසැලද අලුත් බලාපොරොත්තු සමග නව විහාරස්ථානය තුලම පවිතවාගෙන යාමට මේ වන විට සැලසුම් කර තිබෙන නිසා බෞද්ධ විහාර භූමි වටපිටාවක් තුල විහාරස්ථානය තුලම සිංහල භාෂාව ඉගෙන ගැනීමේ අවකාශය දරුවන්ට හිමිවිම ඔබ අප සැමගේම ඉමහත් සතුටට හේතුවනු නොඅනුමානය.

විහාරාරාම ගොඩනැගීම දිවා රෑ පිං සිදුවන අට මහා කුසල් ඝනයට අයිති මහා පිංකමකි. මීට අවුරුදු ගණනාවකට පෙරදී අසස් පරමාර්ථයන්ගෙන් පෙළගැසුණු එම පිරිසගේ සිට අද දක්වා මෙම කටයුතු වල නියැලී දිවා රෑ නොබලා වෙහෙසන බටහිර වික්ටෝරියානු ශ්‍රී ලංකා බෞද්ධ සංගමය නිලධාරි මහත්ම මහත්මීන් නව විහාරස්ථ ඉදි කිරීමේ කටයුතුවල නියැලෙන විහේෂ නිලධාරි මන්ඩලය හා අප විහාරස්ථානයට සම්බන්ධවි සිටින සැමටත් සිතින් පවා සතුටු වන සැමටත්ෙ මී මහා පුණ්‍යකර්මය දිවා රෑ පිං රැස්වන කුසලයක් වන අතර දැනටමත් ඒ සෑම දෙනා මේ මහා පිංකමේ කොටස් කරුවන් වි හමාරයි. මතු සංසාරයේ නිවන් දකිනා තුරා මේ පිංකම ඔබේ සසර ජිවිතය සුවපත් කරනු නියතයී කෙටි වූ අපේ දිවියට දීර්ඝ වු සංසාර ගමනට මේ මහඟු පිංකම ඔබගේ පසුපස එන සෙවනැල්ලක් වේවා යයිද අප ප්‍රාර්ථනා කරමු.

නව විහාරස්ථානයේ මුල්ගල් තැබීමේ මූලික කටයුතු මේ 2019 වසරේ සුභ මොහොතින් මාර්තු මස 10 වෙනි ඉරු දින පෙරවරු 9.00 ට විහාරාධිපති ගෞරවණීය ශාස්ත්‍රපති පල්ලේවල දේවරක්ඛිත හාමුදුරුවන් වහන්සේගේ හා අනිකුත් සියලුම ස්වාමින් වහන්සේලාගේ පොදු බෞද්ධ අබෞද්ධ සියලු දෙනාගේත් සතර පේරුවේ දායක කාරකාදින්ගේත් ප්‍රදේශයේප නතාවගේත් සහයෝගයෙන් හා දායකත්වයෙන් ආරම්භ කිරීමට බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය සංවිධානය කොට තිබේ. ඉදිරි කාලයේදීද විහාරස්ථානය ගොඩ නැගීම් සඳහා ඔබට දායකත්වය ලබා දිය හැකි අතරමෙදිනද ඉදිවන විහාරයේ ගොඩනැගිල්ලේ බැම්මට ශිලාවක් ප5තිස්ඨා




පනය කරමින් ඒ සඳහා බරපැන ලබා දිවා රෑ පිං සිදුවන මහගු පිංකමක කොටස්කරුවන් විය හැකිය. මෙම රමණීය භූමිභාගය සොප්කින්ස් හා හීල් යන පාරවල් එකතුව ප්‍රසිද්ධ දද්ගා හිංදු කෝවිල ආසන්නෙය් ඕන්සයිඩ් හි පිටා ඇතී බස්ර ඨයකින්ද එම ස්ථනාය ලඟා විය හැකි වේී අප ජිවිතයේ කලාතුරකින් ලැබෙන මේ මහා පිංකම හා සත් කාර්ය සඳහා බෞද්ධ අබෞද්ධ ඔබ සිමට අප බෞද්ධ සංගමය කාරුණිකව සැදැහැසිතින්එදිනට ආරාධනා කරමු.

**විමසීම්**
**විහාරස්ථානය**
**97471902**

